# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/14/16/වාර්.භාණ්.සමී/2025 | ........................................ | 2026.01.08 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

**<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය -2025</u>**

උක්ත කරුණට අදාලව අංක DSD/HO/03/ACC/24/භා.සමී හා 2025.11.11 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව මුදල් රෙගුලාසි 176 ප්‍රකාරව සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සෑම වර්ෂයකම අවසානයේ එම ආයතනය සතු ඉන්වෙන්ට්‍රි භාණ්ඩ තොග සමීක්ෂණ කල යුතුවේ.

02. 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල යටතේ ලබාදී ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයට භාජනය කල යුතුව ඇත. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් 2025.11.11 දිනැතිව යොමු කරන ලද ලිපියේ විධිවිධාන අනුව තොග පොත් 2025/12/31 දිනට ශේෂ කල යුතුවේ. ඒ අනුව 2025/12/31 දිනට තොග සමීක්ෂණය කර 2025.11.11 දිනැති ලිපියේ කාල සීමාවන්වලදී අවසන් කල යුතු බව දන්වා සිටිමි.

03. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී දෙපාර්තමේන්තු භාණ්ඩ සමීක්ෂණය සඳහා පත් කරනු ලබන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් එකී සමීක්ෂණ කටයුතු කරන අවස්ථාවේදීම මෙම තොග සමීක්ෂණයද සිදුකල හැකිවේ.

04. සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල වෙනම ගිණුම් තැබිය යුතුව ඇති බැවින්, අදාල තොග සමීක්ෂණ සිදුකර අපහරණ භාණ්ඩ හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ අදාල ආකෘති පත්‍ර අනුව සම්පූර්ණ කර 2026.02.27 දිනට සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශය වෙත ලැබෙන පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
සභාපති - සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල

පිටපත:- ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ග.ස.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |